# කාර්යසාධන වාර්තාව

# 2018

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

නො: *330*

යූනියන් පෙදෙස

කොළඹ *02.*

දුරකතන : *011- 2421211*

ෆැක්ස් : *011- 2434291*

# පෙරවදන

2018 වසර ආරම්භයේදී කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ පැවති ආහාර දෙපාර්තමේන්තුව 2018 මාර්තු 28 දිනැති අංක 2064/26 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා කැබිනට් අමාත්‍ය ධූරය ද ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා රාජ්‍ය අමාත්‍ය ධූරය ද දරණ ලද ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයීය විෂය පථය යටතට පැවරුණි. ඉන්පසුව 2018 නොවැම්බර් මස 05 දිනැති 2096/17 අංක දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ආහාර දෙපාර්තමේන්තුව ගරු මහින්ද අමරවීර මැතිතුමා අමාත්‍ය ධූරය දරණ ලද කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට පවරා ගත් අතර යලිත් 2018 දෙසැම්බර් මස 28 දිනැති අංක 2103/33 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ආහාර දෙපාර්තමේන්තුව ගරු පී.හැරිසන් මැතිතුමා අමාත්‍ය ධූරය දරණ කෘෂිකර්ම ,ග්‍රාමීය ආර්ථික කටයුතු ,පශු සම්පත් සංවර්ධන, වාර්මාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයීය විෂය පථය යටතට පවරා ගැනුණි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දා වනවිට ආහාර දෙපාර්තමේන්තුව එම අමාත්‍යාශය යටතේ සිය පරිපාලනමය කටයුතු සිදු කරන ලදී.

සහල් ආරක්ෂිත තොග පවත්වාගෙන යාම දෙපාර්තමේන්තු මෙහෙවර ප්‍රකාශනය අනුව ප්‍රමුඛ කාර්යයවේ. එම තොග පවත්වාගෙනයාමේ කාර්යය වඩාත් ඵලදායීව ඉටුකරලීම සඳහා වෙයන්ගොඩ දිසා ධාන්‍යාගාර පරිශ්‍රයේ තිබූ ගබඩාවන් දෙකක යාන්ත්‍රික වායු සංසරණ කටයුතු 2018 වසරේදී ආරම්භ කරන ලද අතර මාතර- මැද්දවත්ත ,ගාල්ල - බූස්ස සහ අනුරාධපුර- ශ්‍රාවස්තිපුර ගබඩාවන්හි අලුත්වැඩියා කටයුතු ද 2018 වසර තුළදී සිදු කිරීමට හැකිවීම වසරේ කාර්යසාධනයට එක්වූ කැපී පෙනෙන ප්‍රගතිදායක කාර්යයක් විය.

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලද උපදෙස් අනුව දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට යාබදව එළවලු සහ පළතුරු ගබඩාගත කිරීම සඳහා ශීතාගාර සංකීර්ණයක් ඉදිකිරීමට ඉන්දීය රජය සමඟ අවබෝධතා ගිවිසුමක් 2018 සැප්තැම්බර් මස 17 දින අත්සන් කරන ලදී.දැනට 40 % ක් වන පසු අස්වනු හානිය අවම කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වන අතර ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම ව්‍යාපෘතියේ මූලික වැඩ කටයුතු මේවනවිට ආරම්භ වී තිබේ.

දෙපාර්තමේන්තුවට අයත් ගබඩා කුලියට දීම හා දෙපාර්තමේන්තුවට අයත් ධාන්‍යාගම නිවාස එම ප්‍රදේශයේ රාජකාරියෙහි නියුතු රජයේ සේවකයන් වෙත අවම කුලියක් යටතේ ලබාදීම මඟින් රු. 5,889,756.72වාර්ෂික ආදායමක් රජයේ ආදායමට බැර කිරීමට හැකිවූ අතර හිඟ කුලී මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමුඛතාවක් ලබාදෙමින් කටයුතු කිරීම එම ප්‍රගතිය අත්පත් කර ගැනීමට හේතුකාරණා විය.

ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ කුලී පදනම මත ලබාදී ඇති නිවාස අතරින් එවායෙහි නිවැසියන් විසින් අතුරු බදු ලෙස ලබාදී තිබූ නිවාස හඳුනාගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. එවැනි නිවාසයන්හි පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහාත් හිඟ කුලී අයකර ගැනීම සඳහාත් නීති ප්‍රකාරව කටයුතු කිරීමට ප්‍රමුඛතාවක් ලබාදෙන ලද අතර එම ගැටළු වලින් වැඩි කොටසක් නිරාකරණය කර ගැනීමට හැකිවීමද වසර තුල ලබාගත් ප්රගතියට පිටිවහලක් වී ඇත.

මෙම සියලු ඉලක්කයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් හා අනුමැතියන් ලබාදීම සඳහා කටයුතු කරනු ලැබූ ගරු අමාත්‍යවරුන් හා අමාත්‍යාංශ ලේකම්වරුන්, අමාත්‍යාංශ නිලධාරීන් හා කාර්ය මණ්ඩලද මහත් කැපවීමකින් හා උනන්දුවකින් කටයුතු කරන ලද දෙපාර්තමේන්තුවේ සියලු කාර්ය මණ්ඩලද සිහිපත් කිරීම සඳහා මෙම පෙරවදන පාදක කොට ගන්නා අතර එම සියලු පාර්ශවයන් වෙත හෘදයාංගම ස්තුතිය පුද කිරීමත් ඉදිරි වසර තුල නව මංපෙත් ඔස්සේ දෙපාර්තමේන්තු මෙහෙවර දියත් කිරීමට අවකාශ සැලසේවා යන්නත් මාගේ ප්‍රාර්ථනය වනු ඇත.



ජේ.ක්‍රිෂ්ණමූර්ති
ආහාර කොමසාරිස්
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
2019 පෙබරවාරි මස 27 වන දින

# පටුන


| | | |
|---|---|---|
| 1. | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තු දැක්ම මෙහෙවර | 05 |
| 2. | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යයන් | 06 |
| 3. | සංවිධාන ව්‍යුහය | 07 |
| 4. | පාලන ව්‍යුහය හා කාර්යය මණ්ඩලය | 08-12 |
| 5. | විගණන හා විනය පාලන කටයුතු | 13 |
| 6. | නීතිමය කටයුතු | 14-15 |
| 7. | දෙපාර්තමේන්තු සතු ගබඩා සහ නිවාස | 16-25 |
| 8. | ගිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය | 26-27 |
| 9. | වත්කම් හා දේපල | 28 |
| 10. | ආදායම් සහ අයවීම් | 29 |
| 11. | මුල්‍ය වාර්තා | 30-32 |
| 12. | ක්‍රියාකාරිත්වය හා ප්‍රගතිය | 32 |

# (01) ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තු දැක්ම මෙහෙවර

## දැක්ම

"ආරක්ෂිතව, අඛණ්ඩව,පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සෑම නිවසකටම"

## මෙහෙවර

"ධාන්‍යමය ආහාර ද්‍රව්‍යයන්හි වෙළඳපොළ සුලභතාව, පාරිභෝගිකයාට ලගාවීමේ පහසුව සහ පාරිභෝගික මිලදී ගැනීමේ හැකියාව සුරක්ෂිත කිරීම උදෙසා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පාර්ශව, දෙපාර්තමේන්තුව සතු වත්කම් සහ කාර්යක්ෂම වූත්, කැපවුත් සේවක සමූහයා සමඟ මනා ලෙස සම්බන්ධීකරණය මඟින් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම"

# (02)ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යයන්

1. **දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ (SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙ.ටො. 8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.**
   දකුණු ආසියාතික කලාපීය රටවල හදිසි හා ආපදා සහිත අවස්ථාවලදී ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි මෙ.ටො.8000 ක සහල් සංචිතයක් ශ්‍රී ලංකාව විසින් පවත්වාගෙන යා යුතු බව එකී සංවිධානයේ 16 වන සමුළුවේ දී තීරණය කර ඇත.


2. **2008/8/27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දිවයින පුරා පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො.100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.**
   2008/8/27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අර්බුදකාරී අවස්ථාවන්හි දී ප්‍රයෝජනයට ගැනීම සඳහා මෙ.ටො. 100,000 ක සුරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාමේ අරමුණින් යුතුව ආහාර දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකොට ඇත.

3. **වෙළඳපොළ සහල් සුලභතාවය පිළිබඳ සහතික වීම.**
   වෙළඳපොළ සහල් හිඟයන් ඇතිවීම තුළින් ඇතිවිය හැකි මිල උච්ජාවචනයන් කිරීම සඳහා අත්‍යාවශ්‍ය අවස්ථාවන් හිදී වෙළඳපොළට තොග මුදා හැරීමෙන් සහල් මිලදී ගැනීමේ හැකියාව පාරිභෝගිකයා වෙත ලබා දීම.

4. **ආයතනයේ සම්පත් මනා කළමනාකරණය සඳහා අදාළ පාර්ශවයන් (Stake holders) සමඟ මනා සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම.**
   දෙපාර්තමේන්තුව සතු ගබඩාවන් සහ නිවාස මනා උපයෝගිතාවයකට ලක් කිරීම සඳහා අතිරික්ත ගබඩා හා නිවාස ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව පදනම්කොට කුලියට ලබා දීමෙන් රාජ්‍ය ආදායමට දායකත්වයක් දැක්වීම.

5. **කෘමි උවදුරුවලින් තොර ධාන්‍යමය ආහාර ගබඩා පරිසරයක් ඇති කිරීම.**
   ඉහළ ගුණත්වයෙන් යුතු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා පළිබෝධ උවදුරෙන් තොර ගබඩාවන් පවත්වාගෙන යාම තුළින් පාරිභෝගිකයා වෙත ගුණත්වයෙන් ඉහළ ධාන්‍යමය ආහාර සැපයීම.

## (03) සංවිධාන ව්‍යුහය



ආහාර කොමසාරිස්
නියෝජ්‍ය ආහාර කොමසාරිස්
ප්‍රධාන ගණකාධිකාරී
නීති නිලධාරී
සහකාර ආහාර කොමසාරිස්
ගණකාධිකාරී
පරිපාලන නිලධාරී
තත්ත්ව පාලන නිලධාරී
වැඩ පරීක්ෂක
නීති අංශය
සැපයුම් අංශය
පාලන අංශය
ප්‍රවාහන අංශය
තොරතුරු තාක්ෂණ අංශය
තත්ත්ව පාලන අංශය
ගිණුම් අංශය

# (04) පාලන ව්‍යුහය හා කාර්යය මණ්ඩලය

ආහාර කොමසාරිස් විසින් ක්‍රියාත්මක කළ පරිපාලන හා මෙහෙයුම් වැඩසටහන් ක්‍රියාකාරී අන්දමින් සිදුවෙමින් පැවතිණි.

2018 වසර සඳහා දෙපාර්තමේන්තුවේ සියලුම ගිණුම් කටයුතු ප්‍රධාන ගණකාධිකාරී සහ ගණකාධිකාරී විසින් සිදුකරන ලදී.

ත්‍රිකුණාමලය නිවාස 366 කළමනාකරණය සඳහා ත්‍රිකුණාමලය ස්ථානභාර නිලධාරී කටයුතු කරන ලදී. වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ කළමනාකරණය සඳහා වේයන්ගොඩ ස්ථානභාර නිලධාරී කටයුතු කරන ලදී.

දෙපාර්තමේන්තුවේ නීති අංශය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමන්ගේ අනුමැතිය යටතේ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ නීති උපදේශකගේ වැඩ බැලීම මත කටයුතු කරන ලදී.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අනුමත තනතුරු 82 සඳහා I, II, III පංතිවලට අයත් නිලධාරී මහත්ම මහත්මීන් 24 දෙනෙකු ද විවිධ තනතුරු වලට අයත් අනුමත දෙපාර්තමේන්තුගත සේවක තනතුරු 83 සඳහා සේවකයෝ 50 දෙනෙකු ද ඇතුළුව මුළු අනුමත සේවක සංඛ්‍යාව වු 227 සඳහා 2018.12.31 දිනට කාර්ය මණ්ඩලයේ 101 දෙනෙකු සේවයේ යෙදී ඇත.

2018.01.01 දිනට සේවයේ යෙදී සිටි මුළු සේවක සංඛ්‍යාවෙන් 2% ක් වසර තුළදී විශ්‍රාම ගැනීම සිදු විය.

දීර්ඝ කාලයක් තිස්සේ දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයේ පුරප්පාඩුවක්ව පැවති ධාන්‍ය සමීක්ෂක තනතුර සඳහා 2018 වසරේදී නිලධාරියෙකු බඳවා ගන්නා ලදී.දෙපාර්තමේන්තු පාලන අංශය විසින් නිලධාරීන් බඳවාගැනීමේ කටයුතු,උසස් කිරීමේ කටයුතු සහ පුහුණු කිරීමේ කටයුතු සිදු කරන ලද අතර 2018 වසර තුළදී සිදුකළ නිලධාරීන් පුහුණු කිරීම් පහත පරිදි වේ.

| නිලධාරියාගේ නම | සහභාගී වූ පුහුණු පාඨමාලාව සහ ආයතනය | වැයවූ මුදල ( රු.) |
|---|---|---|
| පී.ඒ.ඩී.එම්.පී.පනන්වල<br>ජේ.ටී.එම්.එන්.ප්‍රසාද්<br>ටී.එම්.ආර්.කේ.තෙන්නකෝන් | කාර්යාල සේවක සේවයේ රාජකාරී පුහුණුව ,<br>ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 18000.00 |
| ඩී.වයි.අරෝෂි | විනය කටයුතු ,මිලෝදා ආයතනය | 13000.00 |
| ආර්.පී.එන්.දිල්රුක්ෂි<br>කේ.පී.ධනුෂ්කා<br>එන්.ඩී.ඒ.ජී.සෝමතුංග<br>එම්.ඒ.මිරිලා | රාජ්‍ය මුදල් රෙගුලාසි ,<br>මිලෝදා ආයතනය | 72000.00 |
| එම්.කේ.ඩබ්ලිව්.හිමාලි<br>එම්.අයි.හාජ්රා | කාර්යාල කළමනාකරණය සඳහා නිපුණතා සංවර්ධනය ,<br>ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 20000.00 |
| එච්.ඩී.ඒ.ජී.සෝමතුංග | වැටුප් සැකසීමේ වැඩසටහන ,මිලෝදා ආයතනය | 18000.00 |
| කේ.ඒ.එස්.එම්.ආරියසිංහ<br>ආර්.එම්.එස්.රත්නායක | වාර්තා ලිවීමේ නිපුණතා ,<br>මිලෝදා ආයතනය | 26000.00 |
| ඊ.පී.ඩී.අයි.මහින්ද<br>යූ.එස්.මධුරංග<br>බී.ඩී.එස්.එස්.රාජපක්ෂ<br>ආර්.එම්.එස්.රත්නායක<br>එල්.ආර්.එන්.සී.රණසිංහ<br>එම්.ජේ.ජී.ලියනගේ | කළමනාකරණ සහකාරවරුන් සඳහා තොරතුරු තාක්ෂණය ,<br>මිලෝදා ආයතනය | 78000.00 |
| යූ.එස්.මධුරංග<br>ඩී.ඩී.එස්.පුෂ්පකුමාර | විනය කටයුතු ,මිලෝදා ආයතනය | 26000.00 |
| ටී.එම්.ආර්.කේ.තෙන්නකෝන් | පිළිගැනීමේ නිළධාරීන් හා දුරකතන ක්‍රියාකරුවන්ගේ කුසලතා වර්ධනය , ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 6000.00 |

| නිලධාරියාගේ නම | සහභාගී වූ පුහුණු පාඨමාලාව සහ ආයතනය | වැයවූ මුදල ( රු.) |
|---|---|---|
| ජී.ජී.අරවින්ද | ගබඩාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව,ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 15000.00 |
| එම්.ඩී.ප්‍රියදර්ශනී | පුද්ගලික ලිපිගොනු කළමනාකරණය ,මිලෝදා ආයතනය | 13000.00 |
| එම්.ජේ.ජී.ලියනගේ | රාජ්‍ය විගණන ක්‍රමවේදයන් , මිලෝදා ආයතනය | 18000.00 |
| ආර්.එම්.එස්.රත්නායක | කණිෂ්ඨ විධායක නිලධාරීන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව, මිලෝදා ආයතනය | 60000.00 |
| එල්.ඩබ්ලිව්.එම්.සුභාෂිණී | වාර්තා ලිවීමේ මූලික නිපුණතා , මිලෝදා ආයතනය | 16500.00 |
| එම්.එල්.සකරියා<br>එම්.ජේ.ජී.ලියනගේ<br>යූ.එස්.මධුරංග<br>ඩී.ඩී.එස්.පුෂ්පකුමාර<br>සී.කේ.කලුආරච්චි | ලේඛන කලමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ පාඨමාලාව ,ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | නොමිලේ පවත්වන ලදී |

**2018 ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩලය**

| අනු අංකය | තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | 2018.12.31 දිනට සේවයේ නියුතු |
|---|---|---|---|
| 01 | ආහාර කොමසාරිස් | 01 | 01 |
| 02 | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 |
| 03 | නියෝජ්‍ය ආහාර කොමසාරිස්/සහකාර ආහාර කොමසාරිස් | 02 | 01 |
| 04 | ගණකාධිකාරී | 02 | 01 |
| 05 | පරිපාලන නිලධාරී | 01 | - |
| 06 | භාෂා පරිවර්තක | 01 | - |
| 06 | තත්ත්ව පාලන නිලධාරී | 01 | 01 |
| 07 | ධාන්‍ය සමීක්ෂක | 01 | 01 |
| 08 | වැඩ පරීක්ෂක | 02 | 01 |
| 09 | තොරතුරු හා සන්නිවේදන සහකාර | 01 | 01 |
| 10 | රාජ්‍ය කළමණාකරණ සහකාර | 82 | 24 |
| 11 | සංවර්ධන නිලධාරී | 22 | 10 |
| 12 | වාප්පු ක්ෂේත්‍ර සේවය | 08 | 08 |
| 13 | රියදුරු | 10 | 07 |
| 14 | කාර්යාල සේවක සේවය | 22 | 08 |
| 15 | ධූමායනකරු | 26 | 08 |
| 16 | රිය සහකරු | 02 | 08 |
| 17 | වාප්පු ක්ෂේත්‍ර කම්කරු | 01 | 01 |
| 18 | මුරකරු | 17 | 17 |
| 19 | ගබඩා කම්කරු | 24 | 02** |
| | **එකතුව** | **227** | **101** |

**ගබඩා කම්කරු තනතුරු සඳහා ආදේශක පදනම මත සහ අනියම් පදනම මත එක් කම්කරුවෙකු බැගින් බඳවාගෙන ඇත.

**1. විශ්‍රාම ගැන්වීම්**

| | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 02 | කාර්යාල කාර්ය සහායක | 01 |

**2. ස්ථානමාරු වී යාම්**

| | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |

**3. ස්ථානමාරු වී පැමිණීම්**

| | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |

**4. දෙපාර්තමේන්තු සේවයෙන් මුදාහැරීම්**

| | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රියදුරු | 01 |

**5. නව බඳවා ගැනීම්**

| | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ධාන්‍ය සමීක්ෂක | 01 |

**6. නව පත් වීම්**

| | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| 02 | රියදුරු | 02 |

# (05) විගණන හා විනය පාලන කටයුතු

- **විගණනය**

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන කාර්යය මණ්ඩලයෙන් සමන්විත රජයේ විගණන අංශයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර ඇත. එමඟින් අවශ්‍ය අවස්ථාවන්හි දී කරනු ලබන විගණනයන්ට අමතරව අවසන් ගිණුම් විගණන කටයුතු ද සිදු කෙරේ.

විගණකාධිපතිවරයා විසින් හා දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පිහිටි රජයේ විගණන අංශය වෙතින් එවනු ලබන විගණන විමසුම් සඳහා වන පිළිතුරු අදාළ පාර්ශවයන් වෙත ඍජුවම යැවීමට කටයුතු කර ඇත.

ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත 2018 දෙසැම්බර් 31 වන දින වන විට විගණන විමසුම් 55ක් ලැබී ඇති අතර එම විගණන විමසුම් සියල්ලම සඳහා පිළිතුරු 2018 වසර තුළදීම ලබා දී ඇත.

2018 පළමු කාර්තුව සහ සිව්වන කර්තුව තුළ විගණන හා කළමනාකරණ කමිටු නොපැවැත්වූ අතර දෙවන කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ද තුන්වන කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ද පැවැත්වූ අතර එම කමිටු සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි විය.

# (06) නීතිමය කටයුතු

2018 වසර අවසානය වන විට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් යෙදී සිටි නීතිමය කටයුතු සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

| අංකය | ස්වභාවය | ක්‍රියාත්මක වෙමින් පවතින නඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධිභාර අයකර ගැනීම | 01 |
| 02 | හිඟ ගබඩා කුලී අයකර ගැනීම | 06 |
| 03 | ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ නිවාස සන්තකය ආපසු ලබාගැනීම | 42 |
| 04 | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙහෙයවන නඩු | 05 |

1. අධිභාර අයකර ගැනීමේ නීතිමය කටයුතු යටතේ ඒ.ඩබ්.ගුණසේකර මහතාගෙන් අයවිය යුතු රු.847,349.43 ක මුදල අයකර ගැනීම සඳහා මහනුවර දිසා අධිකරණයේ ගොනුකර ඇති නඩුව DMR/1046 යටතේ විභාග වේ.
2. තවද අධිභාර අය විය යුතු එච්.එල්.එම්.මෙන්ඩිස්, විල්බට් බෝපගේ, එන්.ඊ.පණ්ඩිතරත්න හා ඕ.ජගත්වීර යන අයගේ අධිභාර මුදල් අය කර ගැනීමට කිසිදු හැකියාවක් නොමැති බැවින් ඔවුන්ගෙන් අයවිය යුතු අධිභාර මුදල් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගණකාධිකාරී වෙත දන්වා ඇත.
3. හිඟ ගබඩා කුලී අයකර ගැනීම යටතේ පහත පරිදි නඩු කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.
    - මල්කඩුවාව GI ගබඩාවට අදාළව නිකවැරටිය ග්‍රීන් වැලි ප්ලාන්ටේෂන් (පුද්) සමාගමට එරෙහිව රු.2,298,029.98 ක මුදල අය කර ගැනීම සඳහා පවරා ඇති නඩුව කොළඹ දිසා අධිකරණ නඩු අංක DMR/1830/2018 යටතේ ක්‍රියාත්මක වේ.
    - ආපන ශාලාවට අදාළව ජී.ඒ.රංජිත් කුමාර මහතාගෙන් අයවිය යුතු රු.816,032.42 ක මුදල අය කර ගැනීම සඳහා පවරා ඇති නඩුව කොළඹ දිසා අධිකරණ නඩු අංක DMR/2466/17 යටතේ ක්‍රියාත්මක වේ.

- වේයන්ගොඩ අංක 04 ගබඩාවට අදාළව බණ්ඩාර ඉන්ඩස්ට්‍රීස් සර්විසස් ( පුද් ) සමාගමෙන් අයවිය යුතු රු.1,153,008.00 ක මුදල අය කර ගැනීම DMR/355/2018 යටතේ නඩු ක්‍රියාත්මක වේ.

4. තවද හිඟ කුලී අය කරගැනීම යටතේ නඩු පවරන ලෙස දන්වා නීතිපති දෙපාර්මේන්තුව වෙත දන්වා ඇති ආයතන වල තොරතුරු පහත පරිදි වේ.
    - කැගල්ල පරගම්මන අංක 1,2 හා 3 ගබඩාවන්ට අදාළව විජිත සමූහ ව්‍යාපාරයෙන් අයවිය යුතු රු.541,017.60 ක මුදල අය කර ගැනීම සඳහා.
    - වේයන්ගොඩ අංක 02 ගබඩාවට අදාළව ඒබල් හෝල්ඩින්ග්ස් ( පුද් ) සමාගමෙන් අය විය යුතු මුදල සම්බන්ධයෙන්
    - මාතර මැද්දවත්ත ,බදුල්ල හා නාරාහේන්පිට අංක 06 ගබඩාවන්ට අදාළව සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමිති සංගමයෙන් අය විය යුතු මුදල් අයකර ගැනීම සඳහා

5. ධාන්‍යගම නිවාස සංකීර්ණයේ නිවාස 42 ක සන්තකය ආපසු අප දෙපාර්මේන්තුව වෙත ලබාගැනීම සඳහා නඩු ලේඛන සැකසීම සහ අවශ්‍ය නීති උපදෙස් ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්මේන්තුව වෙත යොමුකොට ඇත.
6. සහල් භාර නොදීම සම්බන්ධයෙන් එච්.ජී.ආනන්දපාල මහතාට එරෙහිව සහ පී.ජී.රත්නායක මහතාට එරෙහිව නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්මේන්තුව වෙත යොමුකොට ඇත
7. මියන්මාර් සහල් වෙනුවෙන් සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමිති සංගමය අප දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රු.1,942,300.00 ක මුදලින් රු.500,000.00 ක මුදලක් අප වෙත ගෙවා ඇති අතර ඉතිරි ප්‍රමාණය වන රු.1,442,300.00 ක ප්‍රමාණය අය කර ගැනීම සඳහා නීතිපති දෙපාර්මේන්තුව වෙත යොමුකොට ඇත

# (07) දෙපාර්තමේන්තුව සතු ගබඩා සහ නිවාස

- **දෙපාර්තමේන්තුව සතු ගබඩා**

ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩා දිස්ත්‍රික්ක 21 ක පිහිටා ඇති අතර සංඛ්‍යාත්මකව එය 120 කි. රාජ්‍ය දේපළ මනාව කළමනාකරණය කිරීමේ අදහසින් එම දේපළ පහත පරිදි කාර්යයන්හි යොදවා ඇත.

2018/12/31 දිනට ගබඩා පිළිබඳ විස්තර

| | **ගබඩා** | **සංඛ්‍යාව** |
|---|---|---|
| 1 | රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත මාසික කුලී පදනම මත ලබා දී ඇති ගබඩා | 48 |
| 2 | කුලී රහිතව රාජ්‍ය අංශයේ ආයතන වෙත ලබා දී ඇති ගබඩා | 29 |
| 3 | ආහාර දෙපාර්තමේන්තුව භාවිතා කරන ගබඩා | 21 |
| 4 | ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් ලේකම් භාරයේ පවතින ගබඩා | 20 |
| 5 | භාවිතයට නුසුදුසු ගබඩා | 02 |
| | **එකතුව** | **120** |

2018 වසරේදී ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා (මෙට්‍රික් ටොන් 15390 ක් ) අවශ්‍ය ගබඩා 5 ක් ප්‍රතිසංස්කරණය කර තිබේ. එනම් ;

1. අනුරාධපුර ශ්‍රාවස්තිපුර ගබඩා 2 ක්.
2. ගාල්ල බූස්ස ගබඩා 2 ක් .
3. මාතර මැද්දවත්ත ගබඩා 1 ක්.

2018 /2019 මහ කන්නයේදී අපේක්ෂිත ඉහළ වී අස්වැන්න ආරක්ෂිතව ගබඩා කිරීමට අවශ්‍ය ගබඩා පහසුකම් ලබා ලබා දීමේ අරමුණින් යුක්තව උක්ත ගබඩාවන් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදු කරන ලදී.

2018.12.31 දිනට දෙපාර්තමේන්තුව භාරයේ, දැනට කුලී රහිතව හෝ කුලියට දී ඇති ගබඩා සම්බන්ධ වාර්තාව පහත දක්වා ඇත.

**1. රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත මාසික කුලී පදනම මත ලබා දී ඇති ගබඩා.**

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො | ගබඩාව භාවිතා කරන ආයතනය |
|---|---|---|---|---|
| 01 | ඔරුගොඩවත්ත - 01 | 24624 | 6000 | රන්ක් කන්ටේනර්ස් ටර්මිනල්ස් (පුද්.සමා) |
| 02 | ඔරුගොඩවත්ත - 03 | 20304 | 5000 | |
| 03 | ඔරුගොඩවත්ත - 05 | 19008 | 4500 | |
| 04 | ඔරුගොඩවත්ත - 06 | 5000 | 20304 | |
| 05 | ඔරුගොඩවත්ත - 12 | 18183 | 4000 | ශ්‍රී ලංකා රේගුව |
| 06 | ඔරුගොඩවත්ත - 10 | 13436 | | රන්ක් කන්ටේනර්ස් ටර්මිනල්ස් (පුද්.සමා) |
| 07 | ඔරුගොඩවත්ත - 14 | 11448 | | |
| 08 | ඔරුගොඩවත්ත - 15 | 18206 | | |
| 09 | ඔරුගොඩවත්ත - 16 | | | |
| 10 | කාර්යාල ගොඩනැගිල්ල | | | |
| 11 | ඔරුගොඩවත්ත - 09 | 16560 | 4000 | ස.තො.ස.ආයතනය |
| 12 | ඔරුගොඩවත්ත - 02 | 6000 | 24624 | ඩෙලි ලංකා හෝල්ඩින්ග්ස් ( පුද් ) සමාගම |
| 13 | වෙයන්ගොඩ - 02 | 21750 | 4000 | ඒබල්හෝල්ඩින්ග්ස් (පුද්.සමා) |
| 14 | වෙයන්ගොඩ - 04 | 7552 | 900 | බණ්ඩාර ඉන්ඩස්ට්‍රියල් සර්විස් |
| 15 | වෙයන්ගොඩ - 11 | 33200 | 6200 | දොන් මියොන් ආයතනය |
| 16 | වෙයන්ගොඩ - 17 | 6279 | 770 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය |
| 17 | වෙයන්ගොඩ - 09 | 5400 | 28860 | ස.තො.ස.ආයතනය |
| 18 | වෙයන්ගොඩ - 08 | 5400 | 28860 | |
| 19 | බිලැක්පුල් -01 | 1514 | 280 | නුවර එළිය කෘෂිකාර්මික සමුපකාර සමිතිය |
| 20 | බිලැක්පුල් -02 | 1836 | 150 | |
| 21 | බිලැක්පුල් -02 ඉහළ මහළ | 1824 | | |
| 22 | බිලැක්පුල් -03 | 2335 | 435 | |
| 23 | බදුල්ල - 02 | 6781 | 1500 | විදුලිබල මණ්ඩලය |

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| 24 | මල්කඩුවාව - 01 | 5227 | 2000 | ෂෙයිඩ් මොහෙමෙඩ් සමාගම |
| 25 | මල්කඩුවාව - 02 | 4827 | 2000 | |
| 26 | ඕපනායක - 02 | 5300 | 850 | විදුලිබල මණ්ඩලය |
| **27** | මල්කඩුවාව (GI) ගබඩාව | 10498 | 2000 | S.B.M.ඩිස්ට්‍රිබියුටර්ස් |
| 28 | කටුගොඩ - 01 | 20545 | 3825 | ට්‍රයිකෝ මෙරිටයිම් |
| 29 | කටුගොඩ - 02 | 9532 | 1775 | |
| 30 | වැලිගම ගබඩාව | 8019 | 1300 | පියසිරි සිටෝර්ස් |
| 31 | සේනානායක - 01 | 2461 | 390 | සී/ස ජනතා එකාබද්ධ ගොවි සමාගම |
| 32 | සේනානායක - 04 | 2185 | 325 | සී/ස ජනතා එකාබද්ධ ගොවි සමාගම |
| 33 | රත්මලාන - 03 | 41200 | 7520 | ලංකා ස.තො.ස |
| 34 | කහවත්ත - 01 | 3180 | 590 | සී/ස පන්නිලපත්තු වි.සේ.ස |
| 35 | කහවත්ත - 02 | 1881 | 150 | |
| 36 | ඇහැළියගොඩ - 01 | 2337 | 435 | සී/ස ඇහැලියගොඩ වි.සේ.ස |
| 37 | ඇහැළියගොඩ - 02 | 2373 | 435 | |
| 38 | ඇහැළියගොඩ - 03 | 4806 | 900 | |
| 39 | හපුතලේ - 01 | 1653 | 130 | හපුතලේ වි.සේ.ස |
| 40 | හපුතලේ - 02 | 1806 | 120 | |
| 41 | රත්නපුර ගබඩාව | 9611 | 1800 | සී/ස බඹරබොටුව මාරපන වි.සේ.ස සහ ලංකා සතොස ආයතනය |
| **42** | ගැට්ටුවාන - 02 | 5544 | 2000 | ස.තො.ස.ආයතනය |
| 43 | මාතලේ - 01 | 21448 | 3000 | මොහොමඩ් අෂ්රොෆ් මයා |
| 44 | කටුගස්තොට ගබඩාව | 6490 | 1700 | ට්‍රෙන්ඩ්ස් මාර්කටින් |
| 45 | මඩකලපුව - 01 | 18000 | 6000 | බ්‍රැන්ඩික්ස් ඇපරල් ආයතනය |
| 46 | මඩකලපුව - 02 | 17600 | 6000 | |
| 47 | මඩකලපුව - 03 | 17600 | 6000 | |
| 48 | කහඳාව - නව | 7090 | 1900 | මියාමි ආයතනය |
| | **මුළු එකතුව** | **534077** | **106680** | |

**2. කුලී රහිතව රාජ්‍ය අංශයේ ආයතන වෙත ලබා දී ඇති ගබඩා.**

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| 01 | ඔරුගොඩවත්ත - 04 | 19008 | 5000 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය (WFP ) |
| 02 | ඔරුගොඩවත්ත - 07 | 20304 | 5000 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය |
| 03 | වෙයන්ගොඩ - 12 | | | ආර්ථික මධ්‍යස්ථානය |
| 04 | රත්මලාන - 04 | 19032 | 2580 | කම්කරු දෙපාර්තමේන්තුව |
| 05 | රත්මලාන - 05 | 21008 | 2900 | ලංකා සතොස |
| 06 | රත්මලාන - 01 | 50350 | 8530 | ආර්ථික මධ්‍යස්ථානය |
| 07 | වැලිසර | | | ග්‍රාමීය ආර්ථිකය අමාත්‍යාංශය |
| 08 | වැල්ලවත්ත - 01 | 10266 | 2000 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 09 | වැල්ලවත්ත - 02 | 10915 | 2000 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 10 | වැල්ලවත්ත - 03 | 11100 | 2000 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 11 | වැල්ලවත්ත - 04 | 11100 | 2000 | නාවික හමුදාව |
| 12 | ගැට්ටුවාන - 01 | 6336 | 2000 | වී අලෙවි මණ්ඩලය /ලක් සතොස |
| **13** | ගැට්ටුවාන - 03 | 2000 | 5544 | ස.තො.ස.ආයතනය |
| **14** | ගැට්ටුවාන - 04 | 2000 | 5544 | ස.තො.ස.ආයතනය |
| 15 | මුරුක්කන් | 9720 | 1500 | ලෝක ආහාර වැඩසටහන |
| 16 | මන්නාරම | 4356 | 450 | |
| 17 | අම්පාර-01 | 11368 | 2125 | වී අලෙවි මණ්ඩලය |
| 18 | කැකිරාව - 01 | 7950 | 1275 | වී අලෙවි මණ්ඩලය |
| 19 | කැකිරාව - 02 | 7150 | 1145 | වී අලෙවි මණ්ඩලය |
| 20 | මහව - 01 | 4698 | 800 | වී අලෙවි මණ්ඩලය |
| 21 | මහව -02 | 13118 | 1300 | වී අලෙවි මණ්ඩලය |
| 22 | සේනානායක - 02 | 2461 | 396 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 23 | සේනානායක - 03 | 11017 | 2400 | වී අලෙවි මණ්ඩලය |
| 24 | කහඳාව - 01 | 3517 | 1900 | වී අලෙවි මණ්ඩලය |
| **25** | හිඟුරක්ගොඩ - 01 | 23550 | 4400 | වී අලෙවි මණ්ඩලය |
| **26** | හිඟුරක්ගොඩ - 02 | 23550 | 4400 | ස.තො.ස.ආයතනය |
| **27** | මොණරාගල - 01 | 22480 | 3150 | වී අලෙවි මණ්ඩලය |
| **28** | මොණරාගල - 02 | 7000 | 1250 | ස.තො.ස.ආයතනය |
| | **මුළු එකතුව** | **342442** | **64501** | |


**02.** ආහාර දෙපාර්තමේන්තුව භාවිතා කරන ගබඩා

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො | දැනට භාවිතා කරන ආයතනය |
|---|---|---|---|---|
| 01 | වේයන්ගොඩ - 03 | 6142 | 1200 | ආහාර දෙපාර්තමේන්තුව |
| 02 | වේයන්ගොඩ - 07 | 28860 | 5400 | ආහාර දෙපාර්තමේන්තුව |
| 03 | වේයන්ගොඩ - 06 | 7568 | 1100 | ආහාර දෙපාර්තමේන්තුව |
| 04 | ඔරුගොඩවත්ත - 08 | 16560 | 4000 | ආහාර දෙපාර්තමේන්තුව |
| 05 | ඕපනායක-01 | 7730 | 1335 | ආහාර දෙපාර්තමේන්තුව |
| 06 | වේයන්ගොඩ - 16 | 6370 | 1200 | ආහාර දෙපාර්තමේන්තුව |
| 07 | හම්බන්තොට ගබඩාව | 14023 | 4500 | ආහාර දෙපාර්තමේන්තුව |
| 08 | බදුල්ල - 01 | 7245 | 1380 | ආහාර දෙපාර්තමේන්තුව |
| 09 | අම්පාර - 02 | 11368 | 2125 | ආහාර දෙපාර්තමේන්තුව |
| 10 | වේයන්ගොඩ - 05 | 12373 | 1400 | ආහාර දෙපාර්තමේන්තුව |
| 11 | ශ්‍රාවස්තිපුර - 01 | 25520 | 3575 | ආහාර දෙපාර්තමේන්තුව |
| 12 | ශ්‍රාවස්තිපුර - 02 | 23930 | 3350 | ආහාර දෙපාර්තමේන්තුව |
| 13 | කදුරුවෙල -01 | 13419 | 2880 | ආහාර දෙපාර්තමේන්තුව |
| 14 | කදුරුවෙල -02 | 20187 | 3200 | ආහාර දෙපාර්තමේන්තුව |
| 15 | වේයන්ගොඩ - 10 | 28860 | 5400 | ආහාර දෙපාර්තමේන්තුව |
| 16 | වේයන්ගොඩ - 01 | 29040 | 5900 | ආහාර දෙපාර්තමේන්තුව |
| 17 | බූස්ස-02 | 23721 | 3750 | ආහාර දෙපාර්තමේන්තුව |
| 18 | වේයන්ගොඩ - 13 | 24288 | 6800 | ආහාර දෙපාර්තමේන්තුව |
| 19 | වත්තේගම | 5120 | 1000 | ආහාර දෙපාර්තමේන්තුව |
| 20 | මැද්දවත්ත - 01 | 7264 | 965 | ආහාර දෙපාර්තමේන්තුව |
| 21 | බූස්ස-03 | 23721 | 3750 | ආහාර දෙපාර්තමේන්තුව |
| | **මුළු එකතුව** | **343309** | **64210** | |

## 03. ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් ලේකම් භාරයේ පවතින ගබඩා.

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| 01 | පුත්තලම - 01 | 5600 | 600 | දිස්ත්‍රික් ලේකම් (පුත්තලම) |
| 02 | පුත්තලම - 02 | 9600 | 1000 | |
| 03 | නාවක්කුලි (ගබඩා 03) | 43200 | 7500 | දිස්ත්‍රික් ලේකම් (යාපනය) |
| 04 | බුස්ස - 04 | 56784 | | හික්කඩුව ප්‍රා.ලේ |
| 05 | බුස්ස - 05 | 55770 | | |
| 06 | මැද්දවත්ත - 02 | 10000 | 1870 | දිස්ත්‍රික් ලේකම් (මාතර) |
| 07 | වීරවිල (ගබඩා 03) | 13856 | 4500 | තිස්සමහාරාම ප්‍රා.ලේ |
| 08 | කෑගල්ල - පරගම්මන 01 | 5500 | 1500 | දිස්ත්‍රික් ලේකම් (කෑගල්ල) |
| 09 | කෑගල්ල - පරගම්මන 02 | 5500 | 1500 | |
| 10 | කෑගල්ල - පරගම්මන 03 | 3960 | | |
| 11 | කොග්ගල ගබඩාව | 5000 | 925 | හබරාදුව ප්‍රා.ලේ |
| 12 | නිකවැරටිය ගබඩාව | 10496 | 4000 | නිකවැරටිය ප්‍රා.ලේ |
| 13 | වව්නියාව - 02 | 4165 | 165 | දිස්ත්‍රික් ලේකම් (වව්නියාව) |
| 14 | වව්නියාව - 03 | 684 | 160 | |
| 15 | මඩකලපුව - 04 | 13560 | 2800 | දිස්ත්‍රික් ලේකම් ( මඩකලපුව ) |
| 16 | වේයන්ගොඩ -14 | 5368 | 860 | අතතනගල්ල ප්‍රා.ලේ |
| | **මුළු එකතුව** | **249043** | **27380** | |

## ශ්‍රී ලංකාව තුළ ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල ව්‍යාප්තිය



- **දෙපාර්තමේන්තුව සතු නිවාස**


ආහාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන නිවාස 366 ක් ත්‍රිකුණාමලයේ චීන වරායේ ධාන්‍යගම පිහිටා ඇති අතර එම නිවාස පහත සඳහන් පරිදි භාවිතයට ගනු ලැබේ.

2018/12/31 දිනට නිවාස පිළිබඳ විස්තර

| | **නිවාස** | **සංඛ්‍යාව** |
|---|---|---|
| 1 | ආහාර දෙපාර්තමේන්තු කාර්යාලය | 01 |
| 2 | සංචාරක බංගලාව | 01 |
| 3 | අයදුම්කරුවන් වෙත ලබා දීමට නියමිත හා අළුත්වැඩියා කළයුතු | 18 |
| 4 | කුළියට ලබාදුන් | |
| ▪ | ප්‍රීමා ආයතනයේ සේවකයින් සඳහා | 182 |
| ▪ | පෞද්ගලික | 01 |
| ▪ | රාජ්‍ය ආයතන නිලධාරීන් සඳහා | 61 |
| ▪ | ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය | 55 |
| ▪ | අර්ධ රාජ්‍ය ආයතන සඳහා | 47 |
| | **එකතුව** | **366** |


- **නිවාස ආදායම**

| වර්ෂය | ලැබිය යුතු ආදායම (රු) | ලැබු ආදායම (රු) |
|---|---|---|
| 2017 | 5,846,234.00 | 5,734,943.27 |
| 2018 | 2,154,816.00 | 5,889,756.72 |



- ගබඩා ආදායම

| වර්ෂය | ලැබිය යුතු ආදායම (රු) | ලැබු ආදායම (රු) |
|---|---|---|
| 2017 | 80,705,635.64 | 101,130,285.86 |
| 2018 | 94,534,201.96 | 80,980,062.31 |



# (08) ගිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය

ආහාර සුරක්ෂිතතාවය පදනම් කරගත් රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම ප්‍රමුඛ කාර්යයන් සේ සලකා කටයුතු කරමින් දෙපාර්තමේන්තුවේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම සකසා තිබුනි. එම ගමන් මග සාක්ෂාත් වන අන්දමින් ඊට 2018 වාර්ෂික ඇස්තමේන්තුව සකසන ලදී.

දෙපාර්තමේන්තුව විසින් සකසන ලද ඇස්තමේන්තුව මඟින් දක්වන ලද ඇතැම් වැය විෂයන් යටතේ ඉල්ලා සිටින ලද ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තුව මඟින් සලසා දී නොතිබුනි.

තවද ප්‍රතිපාදන ලබා දී තිබූ වැය විෂයන් සඳහා පාලනය කළ හැකි වියදම් පාලනය කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කරන ලදී. වර්ෂය ආරම්භයේදී සකසන ලද ප්‍රසම්පාදන සැලැස්ම හා ඊට අතිරේකව දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන් මු.රෙ.66 මාරු කිරීම් අනුව ඉටු කර ගත හැකි විය.

## පුනරාවර්තන වියදම්

දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන අවම හා පාලනීය වියදම් ප්‍රතිපත්තිය 2018 වර්ෂයේදී ද ක්‍රියාත්මක කිරීම හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු මඟින් පුනරාවර්තන වියදම් යටතේ සලසා දෙන ලද ප්‍රතිපාදන ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීම පහසුවක් වූ අතර වියදම් පාලනය හේතුවෙන් ඇතැම් වැය විෂයන්ගේ ඇතිවූ ප්‍රතිපාදන අතිරික්තය මු.රෙ.66 ප්‍රකාරව නිසි අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අත්‍යවශ්‍ය වැය විෂයන් කිහිපයක් වෙත මාරු කර ගන්නා ලදී.

ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා නොයෑමට වග බලා ගැනීමත්, අවශ්‍ය ප්‍රමාණයට ප්‍රතිපාදන ප්‍රතිශෝධනය කර ගැනීමට හැකිවීමත් මත ගිණුම්කරණ නීතිරීති හා උපදෙස් වලට අනුකූල නොවීමේ අවදානමෙන් මැත් වීමට දෙපාර්තමේන්තුවට හැකිවී ඇත.

## මූලධන වියදම්

මූලධන වැය විෂයය මත වාර්ෂික ඇස්තමේන්තු මඟින් සලසා දී තිබූ ප්‍රතිපාදන උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගෙන ඇත.

## ඇවර කිරීමේ ගිණුම්

දෙපාර්තමේන්තුව සතු ඇවර කිරීමේ ගිණුම් දෙක අතුරින් මුළුතැන්ගෙය හා බේකරි අත්තිකාරම් ගිණුමෙහි ගිණුම් පියවා දමා කටයුතු අවසන් කර ඇති අතර අනෙක් අත්තිකාරම් ගිණුම වූ ආහාර බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුමෙහි පවත්නා වත්කම් දැනට දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා යොදා ගෙන ඇති බැවින් ඒවා උපලබ්ධි කිරීමේ නොහැකියාව මත මෙම ගිණුම ඇවර කිරීමෙහි හැකියාව අවම වී ඇත. ණයගැති ශේෂ කපාහැරීම් අනුමැතිය ලැබෙන පරිදි සිදු කර අතර කාරක පාඩු කපාහැරීම් 2018 වසර තුළදී සිදු කර නොමැත.

රාජ්‍ය ප්‍රතිපත්තිය මත පවත්නා කාලීන අවශ්‍යතාවයන් මූලික කොටගෙන දෙපාර්තමේන්තුව වර්ෂය තුළ ගෙන ඇති ක්‍රියාමාර්ග ඉතා වැදගත් තත්වයක පවතී. එම කටයුත්ත ඉටුකිරීමෙහිලා උද්ගත වූ ප්‍රායෝගික තත්වයන් යටතේ උපරිම කැපවීමකින් හා විනිවිද භාවයෙන් යුතුව හා සියළු නීතිරීති වලට අනුකූලව කටයුතු කරමින් ගැටළුවකින් තොරව වර්ෂයට අදාල ගිණුම් කටයුතු අවසන් කිරීමට හැකිවිය.

# (09) වත්කම් හා දේපල

දෙපාර්තමේන්තුව තුළ පවත්නා වත්කම්, ආහාර බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුම යටතේ අත්පත් කරගෙන ඇති අතර වත්කම් වශයෙන් පවතිනු ලැබ ඇත. එම වත්කම් සියල්ල දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු සඳහා 2018.12.31 දින වන විටත් උපයෝගී කර ගනිමින් පැවතින.

ඒ අනුව 2018.12.31 දිනට වත්කම් විශ්ලේෂණය පහත පරිදි වේ.

| | **වත්කම්** | **පිරිවැය වටිනාකම 2018.12.31 දිනට රු.ශත.** |
|---|---|---|
| **ආහාර බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුම යටතේ පවත්නා වත්කම්** | | |
| I. | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 64,780,643.33 |
| II. | වාහන | 13,282,061.36 |
| III. | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 5,583,704.83 |
| IV. | ලී බඩු සහ කාර්යාලීය උපකරණ | 8,428,903.40 |
| | මුළු එකතුව | **92,075,312.92** |

# (10) ආදායම් සහ අය කිරීම්

- **ආදායම් සහ අයකර ගැනීම.**

| | **2018.01.01 දිනට අයවිය යුතුව පැවති ණය ශේෂය** | |
|---|---|---|
| I | ගබඩා කුලිය | රු. 54,330,341.40 |
| II | නිවාස කුලිය | රු. 3,834,492.68 |
| **එකතුව** | | **රු. 58,164,834.08** |

| | **වර්ෂය තුළ අය කරගත් ආදායම** | |
|---|---|---|
| I | ගබඩා කුලිය | රු. 80,980,062.31 |
| II | නිවාස කුලිය | රු. 5,889,756.72 |
| **එකතුව** | | **රු. 86,869,819.03** |

| | **2018.12.31 දිනට අයවිය යුතුව පැවති හිඟ** | |
|---|---|---|
| I | ගබඩා කුලිය | රු. 80,274,057.74 |
| II | නිවාස කුලිය | රු . 4,541,415.96 |
| **එකතුව** | | **රු. 84,815,473.70** |

# (11) මුල්‍ය වාර්තා

| | |
|---|---|
| ශීර්ෂ අංකය | : 300 |
| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | : ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| වැඩසටහන් අංකය | : 01 |
| ව්‍යාපෘතිය | : 01 |

## පුනරාවර්තන වියදම්

| විස්තරය | 2017 සත්‍ය වියදම රු.ශත | 2018 අනුමත ඇස්තමේන්තුව රු.ශත | 2018 සංශෝධිත ඇස්තමේන්තුව රු.ශත | 2018 සත්‍ය වියදම රු.ශත | 2018 ඉතිරිය රු.ශත |
|---|---|---|---|---|---|
| පුද්ගල වේතන | 51,619,509 | 53,000,000 | 53,200,000 | 52,927,589 | 272,411 |
| වෙනත් | 477,811,826 | 35,720,000 | 32,470,000 | 30,976,852 | 1,493,148 |
| **එකතුව** | **529,431,335** | **88,720,000** | **85,670,000** | **83,904,441** | **1,765,559** |

## මූලධන වියදම්

| වැය විෂය | විස්තරය | 2017 සත්‍ය වියදම රු. | 2018 අනුමත ඇස්තමේන්තුව රු. | 2018 සංශෝධිත ඇස්තමේන්තුව රු. | 2018 සත්‍ය වියදම රු. | 2018 ඉතිරිය රු. |
|---|---|---|---|---|---|---|
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 176,904,303 | 98,000,000 | 128,850,000 | 128,199,551 | 650,449 |
| 2002 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 24,000 | 250,000 | 250,000 | 221,019 | 28,981 |
| 2003 | වාහන | 489,245 | 600,000 | 600,000 | 587,212 | 187,212 |
| 2102 | ලී බඩු හා කාර්යාලීය උපකරණ | 2,003,964 | 500,000 | 2,900,000 | 2,895,460 | 4,540 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 268,980 | 200,000 | 200,000 | 189,750 | 10,250 |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 443,735 | 400,000 | 400,000 | 399,500 | 500 |
| 2502 | ආහාර දෙපාර්තමේන්තු ගබඩා අලුත්වැඩියා | - | - | - | - | - |
| | **එකතුව** | **180,131,227** | **99,950,000** | **133,200,000** | **132,492,492** | **707,508** |

### මූල්‍ය ප්‍රභවයන්

| විස්තරය | 2017 සත්‍ය වියදම රු. | 2018 අනුමත ඇස්තමේන්තුව රු. | 2018 සංශෝධිත ඇස්තමේන්තුව රු. | 2018 සත්‍ය වියදම රු. | 2018 ඉතිරිය රු. |
|---|---|---|---|---|---|
| ඒකාබද්ධ අරමුදල | 253,042,562 | 188,670,000 | 218,870,000 | 214,238,699 | 4,631,301 |
| අලාභ කපා හැරීම් | 456,520,000 | - | 2,300,000 | 2,158,234 | 141,766 |

# (12) ක්‍රියාකාරිත්වය හා ප්‍රගතිය

- **ආදායම් ප්‍රවර්ධනය**

1. දෙපාර්තමේන්තු සතු ගබඩා අතුරින් දෙපාර්තමේන්තු කටයුතු සඳහා භාවිතා නොකරන ලද ගබඩා බාහිර ආයතන වෙත කුලියට / බද්දට ලබාදීම හා දෙපාර්තමේන්තු සතු නිවාස කුළියට දීම ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වන අතර ඒ අතුරින් රන්ක් කන්ටේනර් ටර්මිනල් පුද්ගලික සමාගමින් ලැබෙන ගබඩා කුලී ආදායම හා ධාන්‍යගම ප්‍රීමා නිවාස කුලී ආදායම ප්‍රධාන වේ.

2. ඒ අනුව රු. 80,980,062.31 ක ගබඩා ආදායමක් සහ රු. 5,889,756.72 ක නිවාස ආදායමක් රජයේ ආදායමට බැර කිරීමට හැකියාව ලැබී ඇති අතර, එමඟින් රාජ්‍ය ආදායම ප්‍රවර්ධනයට දායකත්වයක් ලබා දී ඇත.

3. දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ මුළුතැන්ගෙය හා බේකරි අත්තිකාරම් ගිණුමෙහි වත්කම් හා වගකීම් පියවා දමා අවසන් කර ඇත.